**ශීර්ෂය-424 වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

-----------------------------------------------------------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

----------------------------

වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය අමාත්‍යාංශය මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම් ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 7.5 ඡේදය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂය අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂයේ සහ වර්ෂය අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතුය. 2020 වර්ෂය සඳහා සංසන්දනාත්මක සංඛ්‍යාද ඒ අනුව දැක්විය යුතු වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී 2020 වර්ෂයේ සංඛ්‍යා ඇතුළත් කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා නැවත ගලපන ලද ශේෂයන් දක්වා ඇති අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් ලබා දී ඇති ආකෘති පත්‍රය අනුව 2020 වර්ෂය සඳහා ගැලපුම් ගිණුමේ ශේෂයන් දැක්වීම සිදු කල යුතු බව දක්වා නොමැති බැවින් එම ශේෂයේ ඇතුලත් නොකරන ලදී. | 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.1 ඡේදය ප්‍රකාරව CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මගින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම කිසිදු වෙනස් කිරීමකින් තොරව භාවිතා කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වුවද අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුමට අනුව අත්තිකාරම් ගෙවීම්වල වටිනාකම රු.2,198,609 ක් වුවද රු.2,336,499 ලෙස දක්වා තිබුණි. | 253-1-2-4-1502 යටතේ දක්වා ඇත්තේ අත්තිකාරම් ගිණුම් පියවීමක් වන අතර රු.137,890 ක හර ශේෂය අත්තිකාරම් ගෙවීම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර ඇත. | -එම- |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අනාගත සේවා ඉටු කිරීමේ දායකත්වය බලාපොරොත්තුවෙන් සම්පත් සඳහා කරනු ලබන මුදල් ගලායාම් ප්‍රමාණය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන් මගින් නියෝජනය කරන නිසා එම මුදල් ප්‍රවාහයන් වෙනම හෙළිදරව් කිරීම වැදගත් වේ. ඒ අනුව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරිම, හැකියා වර්ධනය සඳහා දරන ලද රු.2,504,734 ක් වූ වියදම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දැක්විය යුතු වුවද එම අගය ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා තිබුණි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම, ප්‍රාග්ධන වියදම් ලෙස දක්වා ඇති බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්හි ආයෝජන ක්‍රියාකාරකම් ලෙස දක්වා ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ii) | අමාත්‍යාංශයේ ශේෂ පිරික්සුම අනුව අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ලද ආයතනය විසින් දරන ලද වියදම රු.37,890 ක් වුවද අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට රු.60,000 ක් ගලපා තිබුනෙන් රු.22,110 ක වෙනසක් නිරීක්ෂණය විය. | උපාධිධාරී නිලධාරීන් සඳහා ගෙවන ලද රු. 20,000 දීමනාව හර කිරීම් රු.60,000 ලෙසත් එම නිලධාරීන් ස්ථිර පත්වීම් ලද පසු වැටුප් ගෙවීමේදී ගෙවන ලද දීමනා සඳහා සිදු කරන ලද ගැලපිම් බැර කිරීම් ලෙස රු.160,000 ක් දක්වා ඇත. අමාත්‍යාංශ ශේෂ පිරික්සුමෙහි දරන ලද වියදම් ලෙස රු.137,890 ක් (හර) දක්වා ඇත. | අමාත්‍යාංශයේ පොත් අනුව වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් ගැලපිය යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ACA-6 සටහනේ දක්වා ඇති පරිදි අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් රු.13,517,923 ක් ලෙස දක්වා තිබුණද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මූල්‍ය නොවන වත්කම් රු.52,317,923 ක් වූයෙන් රු.38,800,000 ක වෙනසක් නිරීක්ෂණය විය | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මහා භාණ්ඩාගාරය (ශීර්ෂ අංක 992) මඟින් මෙම අමාත්‍යාංශය වෙත රු.38,800,000 ක වත්කම් සටහන් කර ඇති අතර එම වත්කම් අමාත්‍යාංශය සතුව නොමැති නිසා එය නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට දන්වා ඇත. | අමාත්‍යාංශ පොත් අනුව මූල්‍ය නොවන වත්කම්වල ශේෂය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මූල්‍ය නොවන වත්කම් ශේෂයට සමාන විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවද අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය සඳහා පිළියෙල කළ ඇස්තමේන්තුවේ වැය විෂයන් 30 ක සියයට 24 සිට 100 දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | කොවිඩ් 19 වසංගත තත්වය, මුදල් අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ප්‍රවාහන වියදම් අවුරා තැබීම වැනි කරුණු මේ සඳහා හේතු විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලසුමකින් හා කළමනාකාරීත්වයකින් යුතුව ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගත යුතුය. |

## 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී විසින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය තත්ව ප්‍රකාශය අවසානයේ “මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු” යනුවෙන් දක්වා ඇති අතර එය ප්‍රධාන ගණන්දීමේ නිලධාරී, ගණන්දීමේ නිලධාරී, ප්‍රධාන ගණකාධිකාරි විසින් සහතික කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය: නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය: අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 සහ 41 වන වගන්ති | ගණන්දීමේ නිලධාරියා විසින් රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකයකු පත්කල යුතු අතර තමන්ට සහාය වීම පිණිස විගණන හා කළමනාකරණ | වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකවරයකු ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව අභ්‍යන්තර | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 සහ 41 වන වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කමිටු පත්කර ආයතනයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව සමාලෝචනය කල යුතු වුවද රාජ්‍ය අමාත්‍යාංශය සඳහා අභ්‍යන්තර විගණකයකු හා විගණන හා කළමණාකරන කමිටුවක් පත් කර නොතිබුණි. | විගණකවරයකු පත්කරන ලදි. මෙම රාජ්‍ය අමාත්‍යාංශය වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය වෙත පැවරීම මත අදාල රාජකාරි හා කාර්යයන් සිදුකිරීමට නොහැකි විය. | |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | i. මුදල් රෙගුලාසි 104(1) සහ 104(3) | පාඩුවක් හෝ අලාභයක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්වය කර එයට වගකිව යුත්තන් නිශ්වය කර පරීක්ෂණ ආරම්භ කළයුතු අතර පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින හතකට වැඩි ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු අතර මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. අනතුරු සිදු වී මාස තුනකට වඩා වැඩි කාලයක් ගත වුවද වාහන අනතුරු 05 ක් සම්බන්ධයෙන් | වනජීවී හා වන සංරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය 2022.03.08 දින සිට වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය වෙත පැවරී ඇති බැවින් පැවති අඩුපාඩු පරීක්ෂාකර ඉදිරියේදී අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | එලෙස කටයුතු කර නොතිබුණි. | | |
| | ii. මුදල් රෙගුලාසි 1642 | වාහන භාවිත කරන නිලධාරීන් විසින් හෝ නිලධාරීන් නොමැති අවස්ථාවක රියදුරන් විසින්, සිදුවන සියලුම හදිසි අනතුරු ළඟම ඇති පොලිසියට දැන්විය යුතු වුවද එසේ කටයුතු කර නොතිබු අවස්ථා 04 ක් නිරීක්ෂණය විය. | -එම- | -එම- |
| (ඇ) | 2017 දෙසැම්බර් 21 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | භාවිත කරන රජයට අයත් සෑම රථයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කළ යුතු වුවත් පරීක්ෂාවට ලක් කළ ලියාපදිංචි සහතිකවලට අනුව වාහන 05 ක අයිතිය 2022 අප්‍රේල් වන විටත් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ පුරප්පාඩු තනතුරු 30 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක්, තෘතියික මට්ටමේ තනතුරු 01 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක් පැවතුණු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරික්ත තනතුරු 01 ක් පැවතුණි. | ඉතා සීමිත ඉඩ ප්‍රමාණයක රාජ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක වූ බැවින් අත්‍යවශ්‍ය තනතුරු සඳහා පමණක් නිලධාරීන් අනුයුක්ත කර ක්‍රියාත්මක කරන ලදී. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |